උක් පර්යේෂණ ආයතනය

# තොරතුරු පත්‍රිකා

අංක
2018 /04

## සරුසාර උක් බිමක් ලබාගැනීමට ඉහළ ප්‍රමිතියකින් යුත්

# බීජ උක් නිෂ්පාදනය හා භාවිතය

උක් වගාවකින් වැඩි ආදායමක් ලබාගැනීමට නම් නීරෝගී සරුසාර පැල වගාවක් හා නිරි වගාවන් ලබා ගැනීමට හැකි වන ලෙස වගා බිමක් ස්ථාපනය කර පවත්වාගත යුතුය. මේ සඳහා ආරම්භයේදී සිටුවන බීජ උක් හොඳින් පැලකර ගැනීමෙන් වගා බිමට ප්‍රමාණවත්වන පඳුරු ප්‍රමාණයක් සහිත වගා බිමක් ස්ථාපනය කරගැනීම අත්‍යවශ්‍ය වේ. මේ ආකාරයට වගා බිමට සරිලන පඳුරු ප්‍රමාණයක් සහිත දිරිමත් වගාවක් ආරම්භ කිරීම පැල වගාවේ පමණක් නොව පසුව නඩත්තු කරනු ලබන නිරි වගාවලින්ද ඉහළ අස්වැන්නක් ලබා ගැනීමට උපකාරී වේ. ඒ ආකාරයට, වගා බිම සඳහා කරනු ලබන වියදමට මෙන්ම අනුගමනය කරනු ලබන නිර්දේශිත වගා පාලන කටයුතු වලින් නිසි ප්‍රතිඵල ලබා ගැනීමට සුදුසු වගාවක් ලබා ගැනීමට නම් සිටුවීම සඳහා සහතික කළ නීරෝගී ගුණාත්මයෙන් උසස් රෝපන ද්‍රව්‍ය යොදා ගත යුතුය.



## ගුණාත්මයෙන් ඉහළ බීජ උක් වල තිබිය යුතු ගති ලක්ෂණ

සැමවිටම සැලසුම් සහගතව නිර්දේශිත ආකාරයට ස්ථාපිත කර නඩත්තු කරන ලද තවානකින් ලබාගනු ලබන බීජ උක් සිටුවීම සඳහා යොදාගත යුතුයි. එසේම සිටුවීමට බීජ උක් තෝරා ගැනීමේදී පහත දක්වා ඇති කරුණු පිළිබඳව සැලකිලිමත් වී ඒ අනුව කටයුතු කළ යුතුය.

- වෙනත් වර්ග මිශ්‍ර නොවූ, අදාල ප්‍රභේදයට පමණක් අයත් උක් දඬු.
- රෝග හා පළිබෝධ හානි වලින් තොර වීම.
- ජල ගැලීම්, සුළං හා ගිනි ගැනීම් වැනි ස්වභාවික ව්‍යසනයන් මගින් හානි නොවී තිබීම.
- අස්වනු නෙලීමේදී, කැබලි කැපීමේදී, ප්‍රවාහනයේදී හා වෙනත් ආකාරයක යාන්ත්‍රික හානි වලට ලක් නොවූ අංකුර සහිත උක් දඬු වීම.
- අධික ලෙස නොමේරූ, මුල් හෝ අංකුර වර්ධනය ආරම්භ නොවූ හැකිතාක් පැල වගාවෙන් හෝ අවම වශයෙන් පළමු නිරි වගාවෙන් පමණක් ලබා ගනු ලැබූ උක් දඬු භාවිතා කිරීම.

### වාණිජ වගාවකින් බීජ උක් ලබා නොගත යුත්තේ ඇයි?

උක් වගාකරන්නන් බොහෝවිට වාණිජ වගාවකින් ලබාගනු ලබන උක් දඬු වගා බිමේ සිටුවීම සඳහා බීජ උක් ලෙස යොදා ගැනීමට පුරුදු වී ඇත. මෙහිදී හොඳ බීජ උක්වල තිබිය යුතු ගති ලක්ෂණ පිළිබඳව සැලකිලිමත් වීමක් දක්නට නොලැබේ. උක් දඬු කැබලි කැපීමේදී බාහිරින් පෙනෙන ලක්ෂණ පමණක් සැලකිල්ලට ගෙන සිටුවීම සඳහා උක්දඬු තෝරා ගනී. සාර්ථක උක් වගාවක් පවත්වා ගැනීම සඳහා මේ ආකාර තේරීම පමණක් ප්‍රමාණවත් නොවේ.


එසේම වාණිජ වගාවකින් ලබාගනු ලබන උක් දඬු සිටුවීම සඳහා යොදා ගැනීම මගින් අළුතින් සිටුවන ලද වගාවට රෝග හා පළිබෝධ කාරකයින් ඇතුළු වීමටත්, රෝග පැතිරීමටත් හේතු වේ. ඉහත කරුණු අනුව ගුණාත්මක බවින් අඩු බීජ උක් සිටුවීම මගින් අළුත් වගාවෙහි පහත සඳහන් තත්වයන් ඇතිවිය හැකිය.

- ප්‍රමාණවත් උක් පැල ගහනයක් සහිත දිරිමත් වගාවක් ලබා ගැනීමට නොහැකි වීම.
- තැනින් තැන පාළු ඇතිවීම.
- ඒකාකාරී වගාවක් ලබා ගැනීමට නොහැකි වීම.
- රෝග හා පළිබෝධ හානි වැඩි වීම.
- පසුව කරනු ලබන බෝග පාලන කටයුතු සඳහා වැඩි ශ්‍රමයක් හා වියදමක් දැරීමට සිදුවීම.
- පැල වගාවේත් පසුව ගනු ලබන නිරි වගාවලත් අස්වනු අඩුවීම.
- නිරි වගා සංඛ්‍යාව අඩු වීම.
- වගාවෙන් ආදායම අඩුවීම.



ජලය හා ශාක පෝෂක බහුල, සක්‍රිය වර්ධන අවස්ථාවේ පවතින, දිරිමත් හා නිරෝගී අංකුර සහිත උක් දඬු බීජ උක් ලෙස යොදා ගැනීම මගින් වඩාත් සාර්ථක ප්‍රතිඵල ලබාගත හැකිය.
ශාඛයේ කායික විද්‍යාත්මක ලක්ෂණ හා ආර්ථික කරුණු පිළිබඳ සලකා බැලීමේදී සිටුවා මාස 09 - 11 පමණ වගාවකින් බීජ උක් ලබා ගැනීම වඩාත් ඵලදායී වේ.

## ගුණාත්මයෙන් ඉහළ බීජ උක් නිෂ්පාදනය කරගත හැකි ආකාරය




හොඳ තත්වයේ රෝපන ද්‍රව්‍ය අවශ්‍ය ප්‍රමාණයට ගුණනය කර ගැනීම සඳහා පහත සඳහන් පියවර දෙකක් මගින් තවාන් ස්ථාපිත කර පාලනය සිදු කරයි.

### 1. ප්‍රාථමික තවාන්

මේ සඳහා හැමවිටම අමිශ්‍ර (වෙනත් ප්‍රභේද මිශ්‍ර නොවූ) ප්‍රභේදයකින් ගත් නිරෝගී උණු දිය ප්‍රතිකාර කරනු ලැබූ උක් පර්යේෂණ ආයතනයේ අත්තිවාරම් බීජ උක් තවාන් වලින් ලබා දෙන බීජ උක් නිර්දේශිත ලෙස ප්‍රතිකාර කර භාවිතා කළ යුතුය. තවානේ ප්‍රමාණය ද්විතීක තවාන් හෝ වානිජ වගා ප්‍රමාණය අනුව තීරණය කළ යුතුය.

### 2. ද්විතීක තවාන්

ද්විතීක තවාන් සිටුවීමට හැමවිටම ඉහත ආකාරයට සකසා ගත් ප්‍රාථමික තවානකින් ලබා ගන්නා බීජ උක් භාවිතා කළ යුතුය. බොහෝවිට ගොවි මහතුන්ට උණු දිය ප්‍රතිකාර කරගැනීමේ පහසුකම් නොමැති බැවින්, ප්‍රතිකාර කර හොඳින් නඩත්තු කළ මූලික තවානකින් ලබා ගත් බීජ උක් භාවිතා කර ද්විතීක තවානක් ස්ථාපිත කර ගැනීම පහසු වේ.

කල්වේලා ඇතිව ප්‍රාථමික හා ද්විතීක තවාන් සැලසුම් කිරීමටත්, නියමිත කාලයේදී එම තවාන් ස්ථාපිත කිරීමත් මගින් අවස්ථා දෙකක් හෝ තුනක් ගුණනය කිරීමෙන් පසු ක්ෂේත්‍රයේ වගා කිරීමට අවශ්‍ය සම්පූර්ණ බීජ උක් ප්‍රමාණය උසස් තත්වයකින් හා අඩු වියදමකින් පිළියෙල කරගත හැකිය. ප්‍රාථමික හා ද්විතීක තවාන් ස්ථාපනය කර පවත්වා ගැනීමේදී ඒවා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමත් අවශ්‍ය ප්‍රමිතියෙන් යුත් බීජ උක් නිර්දේශිත පාලන ක්‍රමවේදයන් අනුගමනය කර සකසා තිබීමත් අත්‍යවශ්‍ය වේ.


## බීජ උක් තවාන් ස්ථාපිත කර පාලනය කිරීම

### තවාන් සැලසුම් කිරීම

■ වානිජ වගාව සිටුවීමට බලාපොරොත්තු වන වර්ෂය/කන්නය පිළිබඳ සලකා බලා එම කාලයේදී නියමිත වයසේ බීජ උක් අවශ්‍ය ප්‍රමාණයෙන් ලබා ගැනීමට හැකිවන ලෙස තවාන් ස්ථාපනය කරනු ලබන කාල සීමාව හා වපසරිය තීරණය කළ යුතුය.

■ වාණිජ වගාව සිටුවීමට මාස 8-.10 පමණ පෙර ද්විතික තවාන් ස්ථාපිත කිරීමටත්, ද්විතික තවාන සිටුවීමට මාස 8.-10 ට පෙර ප්‍රාථමික තවාන ස්ථාපිත කිරීමටත් සැලසුම් කළ යුතුයි. එනම් වානිජ වගාව සිටුවීමට මාස 16-.20 කට පමණ පෙර ප්‍රාථමික තවාන ස්ථාපිත කළ යුතුය.

■ සම්ප්‍රදායක තාක්ෂණයට අනුව (පුරුක් තුනේ උක් දඬු කැබලි එක කැබැල්ලක් අග එක කැබැල්ලක් හෝ 50% ක් අතිපිහිත වන ලෙස අතුරා) සිටුවීමේදී හෙක්ටයාර එකක ඉඩමක් සිටුවීම සඳහා උපරිම වශයෙන් හෙක්ටයාරයකින් 1/10 ක ප්‍රමාණයක තවානක් ස්ථාපිත කළ යුතුය. මෙම හෙක්ටයාර 1/10 ක ද්විතීක තවානක් සිටුවීම සඳහා හෙක්ටයාරයකින් 1/100 ක (වර්ග මීටර් 100 ක් පමණ) ප්‍රාථමික තවානක් ස්ථාපිත කළ යුතුව ඇත. ඉහත කරුණු සලකා බලා පසු ගණනය කිරීම මගින් වාණිජ ඉඩමට අවශ්‍ය බීජ උක් ලබා ගැනීමට ස්ථාපිත කළ යුතු ප්‍රාථමික හා ද්විතික තවාන් වල ප්‍රමාණය තීරණය කළ හැකිය.




■ මේ සඳහා පරතරයක් ඇතිව සිටුවීමේ තාක්ෂණය භාවිතා කිරීමේදී හෙක්ටයාර 1 ක වාණිජ වගාවක් සඳහා හෙ. 1/40 පමණ ද්විතික තවානක් සහ එම ද්විතික තවානේ ප්‍රමාණයෙන් 1/40 පමණ ප්‍රාථමික තවානක් ප්‍රමාණවත් වේ.

### උක් ප්‍රභේදයක් තෝරා ගැනීම

■ මුලින්ම වගා කිරීමට සුදුසු නිර්දේශිත උක් ප්‍රභේදයක් තෝරා ගත යුතුය. මෙහිදී ඉඩම් පිහිටි ප්‍රදේශය, ඉඩමෙහි ස්වභාවය, පාංශු ලක්ෂණ හා වගා ක්‍රමය (වර්ෂා පෝෂිත/ජල සම්පාදිත) යන මූලික කරුණු තුන පිළිබඳව සැලකිලිමත්ව සුදුසු ප්‍රභේදයක් තෝරා ගත යුතුය.

මීට අමතරව ප්‍රභේදයක් තෝරා ගැනීමේදී පහත සඳහන් කරුණු කෙරෙහිද සැලකිලිමත් වීම වගාවෙන් වැඩි අස්වැන්නක් හා ආදායමක් ලබා ගැනීමට හේතු වෙයි.

* ප්‍රභේදයේ මේරීමේ රටාව

  - කෙටි කාලීන
  - මධ්‍ය කාලීන
  - දිගු කාලීන

අස්වැන්න නෙලන කාලය හා ආකාරය අනුව වගාව මේරීම සඳහා ගතවන කාලය පිළිබඳ සැලකිලිමත්ව ප්‍රභේදයක්/ප්‍රභේද තෝරා ගත යුතුය.


* වැඩි නිරි වගා සංඛ්‍යාවක් ලබා ගැනීමට හැකි වීම

* රෝග වලට ප්‍රතිරෝධීතාවය වැඩි වීම

* මල් හට ගැනීමට ඇති ප්‍රවණතාවය අඩු ප්‍රභේදයක් වීම

* අස්වනු නෙලන අකාරය(අතින් නෙලා පටවන්නේද යාන්ත්‍රිකව අස්වනු නෙලීමට බලාපොරොත්තු වන්නේද යන්න සලකා බලා) ඒ සඳහා සුදුසු ප්‍රභේදයක් වීම

* උක් අස්වැන්න හා සීනි අස්වැන්න වැඩි වීම




## වගා බිමක් තෝරා ගැනීම හා බිම සකසා ගැනීම

■ මේ සඳහා ජල වහනය හොඳින් සිදුවන ලවණතාවය හා ආම්ලිකතාවය වැනි පාංශු දුර්වලතාවයන්ගෙන් තොර ප්‍රමාණවත් ගැඹුරකින් යුත් පසක් සහිත පහසුවෙන් ජල සම්පාදනය කළ හැකි ඉඩමක් තෝරා ගත යුතුය.

■ අඩුම වශයෙන් වර්ෂයක පමණ කාලයක්වත් පුරන්ව පැවති ඉඩමක් තවාන සඳහා යොදා ගැනීම මගින් බීජ උක් වගාවට රෝග හා පළිබෝධ ආසාදනයට ඇති ප්‍රවණතාවය අඩු කරගත හැකිය. වාණිජ වගාවන්ගෙන් දුරස්ව හුදකලා ප්‍රදේශයක තවාන් ස්ථාපිත කර ගැනීම මගින් වර්ග මිශ්‍ර වීම මෙන්ම වගාවට ද්විතිකව සිදුවන රෝග හා පළිබෝධ ආසාදන අවම කළ හැකිය.



■ එසේම බීජ තවාන හැකිතාක් සිටුවීමට බලාපොරොත්තු වන ඉඩමට ආසන්නයේ ස්ථාපිත කර ගැනීම මගින් ප්‍රවාහනය සඳහා යන වියදම අඩු කරගත හැකි වන අතර, ප්‍රවාහනයේදී හා බීජ උක් පිළියෙළ කිරීමේදී අංකුර වලට වන යාන්ත්‍රික හානි අවම කළ හැකිය.

■ මෙසේ තෝරාගත් ඉඩමෙහි නිර්දේශිත ආකාරයට හොඳින් බිම් සැකසීම කළ යුතුයි. එනම් වරක් හෝ දෙවරක් සී සෑම, කැට පොඩි කිරීම, ඇලි හා වැටි සැකසීම කළ යුතුයි.

■ තවානෙහි ජල සම්පාදන මාර්ග හා ජල වහන පද්ධති ප්‍රමාණවත් අයුරින් ඉදි කළ යුතුය. එසේම තවානට වල් සතුන්ගෙන් හා නිදැල්ලේ හැසිරෙන ගවයින්ගෙන් වන හානි වලින් ආරක්ෂා කර ගැනීම සඳහා ආරක්ෂිත වැටක් ඉදි කළ යුතුය.

සෑම විටම බිම සකසීමේදී පැරණි උක් වගාවල ඉතිරි වී ඇති දඬු කැබලි හා අවශේෂ කොටස් සම්පූර්ණයෙන්ම ඉවත් කළ යුතුය.









## බීජ උක් සකසා ගැනීම





■ සිටුවීමට බලාපොරොත්තු වන උක් ප්‍රභේදයෙහි නොමේරූ උක් දඬු ප්‍රාථමික තවාන් වල සිටුවීම සඳහා යොදා ගැනීම මඟින් වැඩි ප්‍රරෝහන ප්‍රතිශතයක් ලබාගත හැකිය. මේරූ උක් දඬු ඇත්නම් ඒවායේ අග කොටසෙහි 1/2 හෝ 1/3 පමණ කොටසක් කපා සිටුවීම සඳහා යොදා ගත යුතුයි.


■ තවාන් වල සිටුවීමට උක් දඬු පිළියෙල කිරීමේදී ඒ සඳහා පහත සඳහන් නිර්දේශිත පූර්ව ප්‍රතිකාර ක්‍රම අනුගමනය කිරීම මඟින් නිරෝගී හා දිරිමත් බීජ උක් ලබාගත හැකිය.

## බීජ උක් ප්‍රතිකාර කිරීම



අ) උක් නෙලීම හා කැබලි කැපීම සඳහා ජීවානුහරණය කරන ලද පිහි භාවිතා කිරීම මඟින් පිහි මඟින් පැතිරෙන රෝග හා පළිබෝධ කාරකයින් පාලනය කළ හැකිය.

මේ සඳහා පිහි තලය ගිනි දැල්ලකට ඇල්ලීම හෝ දිලීර නාශකයක ගිල්වීම කල හැකිය.






ආ) බීජ උක් මඟින් පැතිරෙන රෝග හා පළිබෝධ පාලනය සඳහා කපා ගන්නා ලද උක් දඬු උණු දිය ප්‍රතිකාර ක්‍රම මඟින් පිරියම් කළ යුතුව ඇත.


උණුදිය ප්‍රතිකාර ක්‍රම මඟින් ලංකාවේ උක් වගාවල දක්නට ලැබෙන තෘණාකාර කුරුවීමේ රෝගය, සුදු පත්‍ර රෝගය, නිරිවගා කුරු වීමේ රෝගය, කළු දුඹුරු රෝගය හා හරිතක්ෂ පත්‍ර ඉරි රෝග කාරක විනාශ කළ හැකිය.

මේ සඳහා අනුගමනය කරනු ලබන උණුදිය ප්‍රතිකාර ක්‍රමයේදී සිටුවීමට බලාපොරොත්තු වන උක් දඬු සෙල්සියස් අංශක 54 ක උණු ජලයේ මිනිත්තු 50 ක් ගිල්වා තැබිය යුතුයි.




### උණුදිය ප්‍රතිකාර මගින් රෝග හා රෝග කාරක අවම බීජ උක්දඬු ලබා ගැනීම

උණුදිය ප්‍රතිකාර කිරීමේදී 54 $C^0$ උෂ්ණත්වයේ මිනිත්තු 50ක් ප්‍රතිකාර කිරීම නිවැරදිව සිදුකළ යුතුය. ප්‍රතිකාර ටැංකියේ ඇති ජලයේ නියමිත උෂ්ණත්වය ඒකාකාරව පවත්වා ගැනීමෙන් උක් කැබලි ඒකාකාරීව ප්‍රතිකාර වීම සඳහා ප්‍රතිකාර ටැංකි තුල ජලය ගලා යාම (සංසරණ වීම) නිවැරදිව සිදුවිය යුතුය.



නියමිත උෂ්ණත්වයේ පවත්වාගැනීම


උක් දඬු සහිත ටැංකියේ ජලය සංසරණය වීම නිසි පරිදි සිදු වීම


නියමිත පරිදි උණුදිය ප්‍රතිකාර කළ උක් දඬු දිලීර නාශකයේ ගිල්වීම

මේ ආකාරයට පිළියෙල කර ගත් බීජ උක් සිටුවා ස්ථාපිත කරන ලද ප්‍රාථමික තවාන් වලින් නෙලාගනු ලබන උක්දඬු ද්විතික තවානෙහි සිටුවීමෙන් වාණිජ වගාවේ සිටුවීම සඳහා ගනු ලබන උක් දඬු බෝහෝ දුරට රෝග හා පළිබෝධ

කාරකයින්ගෙන් තොරව පවත්වාගත හැකි බව පෙනී ගොස් ඇත.

ඈ) මීට අමතරව ප්‍රාථමික හා ද්විතීක තවාන් වල සිටුවීමට පෙර උක් දඬු දිලීර නාශකයක ගිල්වීම මගින් ක්ෂේත්‍රයේ සිටුවීමෙන් පසුව දඬු කැබලි හා අංකුර කුණුවීමේ රෝගයෙන් ආරක්ෂා කර වැඩි ප්‍රරෝහන ප්‍රතිශතයක් ලබාගත හැකිය.

ඇ) සිටුවීමට පෙර උක් දඬු කැබලි සංස්ථානික කෘමි නාශකයක ගිල්වා ගැනීම මගින් වේයන්, කරටි විදින පනුවන් (මුල් කාලයේ) හා කොරපොතු කෘමීන් වැනි පළිබෝධකයින්ගෙන් වන හානිය අවම කර ගත හැකිය.

## තවාන් බිමේ සිටුවීම සහ නඩත්තු කිරීම



ඉහත ආකාරයට ප්‍රතිකාර කරන ලද උක් දඬු සාමාන්‍ය නිර්දේශිත ක්‍රමයට ක්ෂේත්‍රයේ සිටුවීම කළ හැකිය. මාස 10 ක් වැනි කෙටි කාලයකදී අස්වනු නෙලන නිසාත් නිරිවගා කීපයක් බලාපොරොත්තු නොවන නිසාත් පේළි අතර සෙ.මී.75-90 පමණ අඩු පරතරයකින් සිටුවීම කළ හැකිය.

■ වාණිජ ක්ෂේත්‍රයක සිටුවනවාට වඩා 25% පමණ වැඩි උක් දඬු ප්‍රමාණයක් යොදා තවාන් සිටුවීම; ඒ මගින් තවාන සඳහා යොදා ගනු ලබන උක් දඬු වලට කරනු ලබන පූර්ව ප්‍රතිකර්ම නිසා හෝ වෙනත් හේතු නිසා සිදු විය හැකි ප්‍රරෝහන දුබලතා මගින් පාළු ඇතිවීමට ඇති අවධානම අවම කර ආරම්භයේදී සිටම උපරිම පැල ගහනයක් පවත්වාගත හැකිය.



නිසි පරිදි වල් පැළෑටි මර්දනය කර නිර්දේශිත අකාරයට පොහොර දමා නඩත්තු කිරීම

■ ජල සම්පාදනය, වල් පැළෑටි මර්දනය, පොහොර යෙදීම වැනි පාලන කටයුතු නිසි කාලයේදී නිර්දේශිත පරිදි ඉටු කළ යුතුය.

## වගාබිම පරීක්ෂා කිරීම

■ නිරන්තර සති දෙකකට වරක්වත් වගාව පරීක්ෂාවට ලක් කළ යුතුයි. රෝග හා පළිබෝධ ඇත්නම් ආසාදිත පැල හා පඳුරු ගලවා ඉවත් කළ යුතුයි. අනතුරුව ඒ සඳහා නිසි ප්‍රතිකාර ක්‍රම කළ යුතුයි. වෙනත් වර්ග වල උක් ප්‍රභේද මිශ්‍ර වී ඇත්නම් ඒවාද තවාන් වලින් ගලවා ඉවත් කළ යුතුය.



වගා බිම පරීක්ෂා කර වෙනත් පැරණි උක් දඬු / මුල් වලින් මතුව ඇති පැල ගලවා ඉවත් කිරීම

■ වගාව ගිනි ගැනීමෙන්, පෙරලීමෙන්, සතුන්ගෙන් වන හානි වලින් හා වෙනත් යාන්ත්‍රික හානි වලින් වලක්වාගත යුතුය.

■ බීජ උක් අස්වනු නෙලීමට සති 2 - 3 පමණ පෙර තවානට අමතරව පොහොර මාත්‍රාවක් යෙදීම මගින් නෙලාගනු ලබන බීජ උක් වල ප්‍රරෝහන ශක්තිය වැඩිකර ගත හැකිය. මේ සඳහා නයිට්‍රජන් හා පොටෑෂ් පොහොර ඉතාමත් වැදගත්ය. හෙක්ටයාරයකට යූරියා කි.ග්‍රෑ.100 ක් හා මියුරියේට් ඔෆ් පොටෑෂ් කි.ග්‍රෑ.25 ක් පමණ යෙදීම යෝග්‍යයි. දැනට පොටෑසියම් බහුලව ඇතැයි හඳුනාගෙන ඇති සෙවනගල හා උඩවලව ප්‍රදේශයේ පස් වල නම් යූරියා පමණක් යෙදීම ප්‍රමාණවත්ය.



රෝග වලට පාත්‍රී වූ උක් පඳුරු ගලවා ඉවත් කර පුළුස්සා දැමීම



■ වියළි කාලගුණයක් පවතී නම් ජල ඌණතාවයකට ලක් නොවන ආකාරයට නිරන්තරව ජල සම්පාදනය කළ යුතුයි. මීට අමතරව බීජ උක් කැපීමට දින 3.-4කට පමණ පෙර වගාවට හොඳින් ජල සම්පාදනය කිරීම මගින් පැලවීම ඉක්මන් කර ගත හැකිය.

■ වගාවට මාස 9-10 පමණ කාලයකදී සිටුවීම සඳහා බීජ උක් අස්වනු නෙලීම යෝග්‍යයි. අස්වනු නෙලීම සඳහා ජීවානුහරණය කරනු ලද පිහි භාවිතා කිරීම මගින් රෝග කාරකයින් පැතිරීම පාලනය කළ හැකිය.

## බීජ උක් තවාන් පරීක්ෂා කිරීම

අවම වශයෙන් පහත දක්වා ඇති අවස්ථා (පියවර) තුනකදීවත් සම්පූර්ණයෙන්ම හා විධිමත්ව තවාන් පරීක්ෂා කළ යුතුය.

- පළමු පරීක්ෂාව (I පියවර) සිටුවා දින 45 - 60 අතර කාලයේදී
  - -වර්ග වෙන් කර සිටුවා ඇති ආකාරය පරීක්ෂා කිරීම.
  - -වර්ග මිශ්‍ර වී ඇත්දැයි පරීක්ෂා කිරීම.
  - -රෝග, පළිබෝධ හා වෙනත් හානි පරීක්ෂා කිරීම.
- දෙවන පරීක්ෂාව (II පියවර) සිටුවා දින 120 - 130 දී පමණ
  - -වෙනත් වර්ග මිශ්‍ර වී ඇතිදැයි පරීක්ෂා කිරීම.
  - -රෝග, පළිබෝධ හා වෙනත් හානි පරීක්ෂා කිරීම.
- තුන්වන පරීක්ෂාව (III පියවර) අස්වනු නෙළීමට දින 15 කට පෙර
  - -වෙනත් වර්ග මිශ්‍ර වී ඇත්දැයි පරීක්ෂා කිරීම.
  - -රෝග, පළිබෝධ හා වෙනත් හානි පරීක්ෂා කිරීම.




## බීජ පනත යටතේ සහතික බීජ උක්වල තිබිය යුතු ප්‍රමිතීන්

### සාමාන්‍ය අවශ්‍යතා (බීජ උක් නිපදවීමේදී)

01. අත්තිවාරම් බීජ උක් තවාන් වානිජ වගාවකින් මීටර් 100 ක අවම දුරකින් හා වානිජ බීජ උක් තවාන් වානිජ වගාවකින් මීටර් 15 ක අවම දුරකින් ස්ථාපිත කර තිබිය යුතුය.

02. ප්‍රභේද කිහිපයක් එකම තවානේ ඇති විට එම ප්‍රභේද මිශ්‍ර නොවන ලෙස වෙන් කර තිබිය යුතු අතර එම ප්‍රභේද සහිත වගා කොටස් අවම වශයෙන් මීටර් 3 ක් පළල බිම් තීරුවකින් වෙන්ව තිබිය යුතුය.

### විශේෂ අවශ්‍යතා (බීජ උක් නිපදවීමේදී)

| | අවශ්‍යතා/ ප්‍රමිතීන් | ක්ෂේත්‍ර පරීක්ෂා කිරීමේ පියවර | උපරිම ඉඩ දියහැකි සීමා | |
|---|---|---|---|---|
| | | | අත්තිවාරම් බීජ උක් | වානිජ බීජ උක් |
| 1 | අවම ප්‍රවේනික පරිශුද්ධතාවය (%) | I, II, III | 100 | 98 |
| 2 | ප්‍රභේද මිශ්‍රවීම (%) | I, II, III | 0*** | 0*** |
| 3 | නම්කරන ලද රෝග ආසාදනය | | | |
| | අ. කළු දුඹුළු රෝගය (%) | I<br>II<br>III | 0.02*<br>0.01*<br>0*** | 0.02*<br>0.01*<br>0*** |
| | ආ. සුදු පත්‍ර / තෘණාකාර කුරුවීමේ රෝගය (%) | I<br>II<br>III | 0.05*<br>0.05*<br>0*** | 0.50*<br>0.50*<br>0*** |
| | ඇ. පත්‍ර ප්‍රදාහය (%) | I<br>II | 0.01*<br>0*** | 0.05*<br>0*** |
| 4 | නම් කරන ලද පළිබෝධ ආසාදනය | | | |
| | අ. කඳන් විදින පණුවා(%) | III | 10 | 10 |
| | ආ. ප්‍රරෝහ විදින පණුවා(%) | I | 20 | 20 |
| | ඇ. පයිරිල්ලා පත්‍ර කීඩෑවා (පත්‍රයක සිටින සතුන් ගනන) | II,III | 10 | 10 |
| | ඈ. උක් වූල් කූඩිත්තා, කොරපොතු කෘමීන්, පිටි මකුණා(%) | III | 5/0**/*** | 5/0**/*** |

*සම්පූර්ණ පඳුරම වහාම ගලවා ඉවත් කළ යුතුය
**අදාල පළිබෝධකයා වාර්තා නොවූ ප්‍රදේශ
***කිසිසේත්ම නොතිබිය යුතුය.

## බීජ උක් ක්ෂේත්‍රයේ සිටුවීම

1. විජලනය, නෙලාගත් උක් දඬු වල ප්‍රරෝහන ශක්තිය අඩු කිරීමට බලපාන ප්‍රධාන සාධකයකි. බීජ උක් අස්වනු නෙලා සකස් කරගත් විගස සිටුවීම මගින් මෙම තත්වය මගහරවා ගත හැකිය. මේ සඳහා බීජ උක් අස්වනු නෙලීමට ප්‍රථම සිටුවීමට බලාපොරොත්තු වන ඉඩම් පිළියෙල කරගත යුතුය. සිටුවීමේ යම්කිසි ප්‍රමාදයක් සිදුවේනම් නෙලා ගන්නා ලද බීජ උක් සෙවන ඇති ස්ථානයක ගොඩගසා ඒවා උක් කොළ රොඩු මගින් ආවරණය කර, වියළීමෙන් ආරක්ෂා වන පරිදි ජලය ඉසීම කළ යුතුය.

2. බීජ උක් ප්‍රවාහනය, පරිහරණය හා කැබලි කැපීම සැලකිලිමත්ව හා අංකුර වලට හානි නොවන සේ කිරීම මගින් යාන්ත්‍රිකව වන හානි අවම කළ හැකිය. මෙහිදී වියළි කොළ හා කරටි ඉවත් නොකර නෙළු බීජ උක් දඬු ප්‍රවාහනය කළ යුතුය.

3. යාන්ත්‍රිකව හානිවූ අංකුර සහිත දඬු කැබලි, මුල් හා අංකුර වර්ධනය වී ඇති දඬු කැබලි තෝරා ඉවත් කළ යුතුයි.

4. වෙනත් වර්ග වල උක් දඬු ඇත්නම් ඒවාද තෝරා ඉවත් කළ යුතුයි.

5. මෙසේ සකස් කරගත් හොඳ තත්වයේ බීජ උක් නිර්දේශිත ආකාරයට සිටුවීම හා අනෙකුත් පාලන කටයුතු නිසි ආකාරයෙන් ඉටු කිරීම මගින් සාර්ථක උක් වගාවක් පවත්වාගත හැකිය.



බීජ ප්‍රවාහනයේදී උක් අංකුරයට හානී වීමෙන් ආරක්ෂා කළ යුතුය



බීජ උක් සෙවන ඇති ස්ථානයක තබා ආවරණය කර ජලය ඉසීම

**තවාන් ස්ථාපනය කර පවත්වාගැනීමේදී සැම විටම බීජ පනතට අනුකූලව කටයුතු කළ යුතු අතර ඒ සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.**

### බීජ පනත යනු කුමක් ද?

ශ්‍රී ලංකාව තුල වාණිජ මට්ටමින් හුවමාරු වන බීජ හා රෝපණ ද්‍රව්‍යවල පිලිගත් ප්‍රමිතීන් තහවුරුකර ගුණාත්මයෙන් යුත් බීජ හා රෝපණ ද්‍රව්‍ය ගොවීන් වෙත ලබා දීම සඳහා ගන්නා ලද නීතිමය පියවර 2003 අංක 22 බීජ පනත නමින් හැඳින්වෙයි. 2003 අගෝස්තු 01 දිනැති ගැසට් පත්‍රයකින් එය ප්‍රසිද්ධ කර ඇත.

### බීජ පනතක අවශ්‍යතාවය කුමක්ද?

රටක වානිජ වශයෙන් හුවමාරුවන බීජ හා රෝපණ ද්‍රව්‍යවල තිබිය යුතු ප්‍රමිතීන් තීරණය කිරීම ඒවා හා සම්බන්ධ ආයතන හා පුද්ගලයින් විසින් සිදුකරනු ලබයි. එම ප්‍රමිතීන් පනත යටතේම පත්කරනු ලබන ජාතික බීජ සභාව මගින් පිළිගත් පසු සියලුම බීජ හා රෝපන ද්‍රව්‍ය හුසුරුවන්නන් විසින් තම නිෂ්පාදන වල එම ප්‍රමිතීන් අඩංගු බව ලේබලයක් මගින් තහවුරු කළ යුතුය. මෙමගින් පාරිබෝගිකයාට නිෂ්පාදනයේ ගුණාත්මය පිළිබඳ දැනුමක් ලබාදේ. එම පිළිගත් සම්මතයන් නිෂ්පාදනය කරන, බෙදාහරින, අලෙවිකරන සියළුම ද්‍රව්‍යවල අඩංගු වීම අනිවාර්ය වේ. ඔවුන් ගෙවනු ලබන මුදලට සාධාරන වටිනාකමක් ලබාදෙන අතර, ගුණාත්මයෙන් යුතු රෝපන ද්‍රව්‍ය කෘෂිකාර්මික නිෂ්පාදනයේදී භාවිතා වීම හේතුවෙන් රටේ සමස්ත නිෂ්පාදනය ඉහළ යාමක්ද අපේක්ෂා කළ හැකි වේ.

### ලේබලයක අඩංගු වියයුතු තොරතුරු

අලෙවිය සඳහා ඉදිරිපත් කෙරෙන සියලුම බීජ හා රෝපණ ද්‍රව්‍ය ඇසුරුම් වල බීජ සහතික කිරීමේ සේවය සමග එකඟතාවයෙන් සාදාගත් ලේබලයක් අමුණා හෝ අලවා තිබිය යුතු වන අතර එහි පහත සඳහන් තොරතුරු පැහැදිලිව සඳහන් විය යුතුය.

1. බෝගයේ හා ප්‍රභේදයේ පොදු නාමය
2. බීජ තොග අංකය
3. බීජ පන්තිය
4. ශුද්ධ බර හෝ පරිමාව හෝ සංඛ්‍යාව
5. අවම පැළවීමේ ප්‍රතිශතය
6. පාරිශුද්ධතාව ප්‍රතිශතයක් ලෙස
7. කල් ඉකුත්වන දිනය
8. බීජ ප්‍රතිකාරකයක් යොදා ඇත්නම් ඒ බව සහ පාරිභෝජනයට නුසුදුසු බව
9. බීජ ඇසුරුම්කරුගේ නම, ආයතනය, ලිපිනය සහ ලියාපදිංචි අංකය.

## බීජ පනත කා සඳහාද?

රටතුල නිෂ්පාදනය වන බීජ හා රෝපණ ද්‍රව්‍යවල ප්‍රමිතීන් තහවුරු කිරීමට අමතරව රට තුලට ආනයනය කෙරෙන බීජ හා රෝපණ ද්‍රව්‍යවල ගුණාත්මයද පරීක්ෂාවට ලක් කෙරෙන බැවින් රට තුලට හානිකර කෘමි රෝග හා වල් පැළෑටි ආදිය සංක්‍රමනය වීම වැලකේ. මෙම පනත තුලින් බීජ හා රෝපණ ද්‍රව්‍යවල ගුණාත්මක භාවය රැකෙන පරිදි නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, බෙදාහැරීම ආදී සියලුම කටයුතු ආවරණය කිරීමට කටයුතු සම්පාදනය වී ඇත. ඒ තුලින් ගොවියා ආරක්ෂාවීම අපේක්ෂා කෙරේ.

## පනතේ බලධාරියා කව්රුන් ද?

මෙම පනත ක්‍රියාත්මක කිරීමේ බලධාරියා ලෙස කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කර ඇත. ඔහු විසින් එම කටයුතු දිවයින පුරා ක්‍රියාත්මක කිරීම පහසුකර ගැනීම සඳහා බලයලත් නිලධාරීන් පත් කරනු ලැබේ.

## ක්‍රියාත්මක කිරීමේ ආයතනය

බීජ සහතික කිරීමේ හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය,
ගන්නෝරුව,
පේරාදෙනිය.

## බලයලත් නිලධාරීන්ගේ කාර්යභාරය

1. තම බල ප්‍රදේශයේ සිටින සියලුම බීජ පරිහරණය කරන්නන්ගේ කටයුතු පරීක්ෂා කිරීම
2. ලියාපදිංචියේදී එකඟ වූ කොන්දේසිවලට අනුකූලව කටයුතු කරන්නේද යන්න සොයා බැලීම.
3. අලෙවියට තබා ඇති බීජ ජාතික බීජ සභාව අනුමත ප්‍රමිතියට අනුකූලද යන්න පරීක්ෂා කිරීම සඳහා සාම්පල ගැනීම.
4. බීජ හෝ රෝපණ ද්‍රව්‍ය පිළිබඳ ලිඛිතව හෝ වාචිකව ලැබෙන පැමිණිලි පරීක්ෂාවට භාජනය කිරීම.
5. කරන ලද සියලුම පරීක්ෂාවන් හා ගන්නා ලද ක්‍රියා මාර්ග පිළිබඳ තොරතුරු තබා ගැනීම.
6. බීජ හසුරුවන්නන් පනතේ නීති හා රෙගුලාසි වලට පටහැනිව ක්‍රියා කරන අවස්ථාවල අවශ්‍ය පියවර ගැනීම.

## ලියාපදිංචිය ලබාගන්නේ කෙසේද?

- බීජ පනත යටතේ කෘෂිකාර්මික බෝග මෙන්ම වැව්ලි බෝගද අපනයන බෝගද ආවරණය කෙරෙන බැවින් එම බෝග වල බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදකයින්, ආනයනකරුවන්, බෙදාහරින්නන්, ඇසුරුම්කරුවන්, නැවත අසුරුම්කරුවන්, ගබඩාකරුවන්, අලෙවිකරුවන් ආදී සියළුම බීජ හසුරුවන්නන්ද එම කටයුතු වල නිරත වීමට නීතිමය බලයක් ලබාගැනීම සඳහා නියමිත ලියාපදිංචි ගාස්තුව ගෙවා කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වරයා වෙත ලියාපදිංචි විය යුතුය.

- නියෝජ්‍ය අධ්‍යක්ෂක, බීජ සහතික කිරීමේ සේවය, ගන්නෝරුව, පේරාදෙණිය වෙතින් හෝ අදාල ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක කාර්යාලයෙන් ලබාගත් පෝරමයක් නිවැරදිව පුරවා මුදල් ඇණවුමක් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් නමින් ලබාගෙන ගෙවන කාර්යාලය, පේරාදෙනිය ලෙස සඳහන් කර තැපෑලෙන් හෝ පැමිණ භාරදිය යුතුය.

බීජ පනත පිළිබඳ තොරතුරු කෘෂිකර්ම දෙපාර්තමේනතුව විසින් නිකුත් කරන ලද අත් පත්‍රිකාව ඇසුරෙනි.

විෂය උපදේශකත්වය
ආචාර්ය ඒ.පී. කීර්තිපාල, - අධ්‍යක්ෂ
ආචාර්ය ඩබ්. ආර්. ජී. විතාරම - නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)
පී.ඒ.ඒ. චතුරංග - පර්යේෂණ නිළධාරි

සංස්කරණය හා පිටු සැකැස්ම
ආචාර්ය එම්. එස්. පෙරේරා - ප්‍රධාන පර්යේෂණ නිළධාරි

ප්‍රකාශනය
තාක්ෂණ හුවමාරු හා සංවර්ධන අංශය
උක් පර්යේෂණ ආයතනය
උඩවලව

දුරකථන : 047 4937346, 0474937335
ෆැක්ස්: 047 2233233
විද්‍යුත් තැපෑල: extensionsri@yahoo.com
වෙබ් අඩවිය: www.sugarres.lk